# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2026 ජනවාරි 30 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2025 දෙසැම්බර්

## ජංගම ගිණුමේ ශේෂය




## සංචාරක ඉපැයීම්



එ.ජ.ඩො. මිලියන **309** *
*2025 දෙසැම්බර් මාසයේ දී*

එ.ජ.ඩො. මිලියන **362**
*2024 දෙසැම්බර් මාසයේ දී*

එ.ජ.ඩො. බිලියන **3.2** *
*2025 වසරේ දී*

එ.ජ.ඩො. බිලියන **3.2**
*2024 වසරේ දී*

* ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලැබූ නව සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ **



එ.ජ.ඩො. මිලියන **879**
*2025 දෙසැම්බර් මාසයේ දී*

එ.ජ.ඩො. මිලියන **614**
*2024 දෙසැම්බර් මාසයේ දී*

එ.ජ.ඩො. බිලියන **8.1**
*2025 වසරේ දී*

එ.ජ.ඩො. බිලියන **6.6**
*2024 වසරේ දී*

** විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිරිවා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය

## මුළු අපනයන
*(භාණ්ඩ හා සේවා)*

එ.ජ.ඩො. මිලියන **1,879**
*2025 දෙසැම්බර් මාසයේ දී*
*4.2% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*



එ.ජ.ඩො. බිලියන **20.6**
*2025 වසර තුළ දී*
*4.9% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*

## භාණ්ඩ අපනයන

එ.ජ.ඩො. මිලියන **1,158**
*2025 දෙසැම්බර් මාසයේ දී*
*5.1% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*



## භාණ්ඩ අපනයන

එ.ජ.ඩො. බිලියන **13.6**
*2025 වසර තුළ දී*
*6.3% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*

## සේවා අපනයන

එ.ජ.ඩො. මිලියන **721**
*2025 දෙසැම්බර් මාසයේ දී*
*2.7% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*
*සහාය විය.*



## සේවා අපනයන

එ.ජ.ඩො. බිලියන **7.1**
*2025 වසර තුළ දී*
*2.3% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*
*සහාය විය.*

## භාණ්ඩ ආනයන

එ.ජ.ඩො. මිලියන **2,155**
*2025 දෙසැම්බර් මාසයේ දී*
*12.0% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*

එ.ජ.ඩො. බිලියන **21.5**
*2025 වසර තුළ දී*
*14.0% (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)*

## වෙළඳ හිඟය

**2025 දෙසැ.: එ.ජ.ඩො. මිලියන 997**
2024 දෙසැ.: එ.ජ.ඩො. මිලියන 823

**2025: එ.ජ.ඩො. බිලියන 7.9**
2024.: එ.ජ.ඩො. බිලියන 6.1

## දළ නිල සංචිත ***

එ.ජ.ඩො. බිලියන **6.8**
2025 දෙසැම්බර් අවසානයට



ආනයනික ආවරණය මාස **3.8**

*** චීන මහජන බැංකුව සමඟ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළුව

## විනිමය අනුපාතිකය
(එ.ජ. ඩොලරයට රුපියල්)




**2026 වසර ආරම්භයේ සිට ජනවාරි මස අවසානය දක්වා කාලය තුළ දී**

අතිප්‍රමාණය
**0.2%**

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය

# 2025 දෙසැම්බර්

- 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී ජංගම ගිණුමේ සුළු අතිරික්තයක් වාර්තා විය. 2025 වසරේ බොහෝ මාසවල දී මාසික ජංගම ගිණුමේ අතිරික්තයන් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස, තාවකාලිකව ඇස්තමේන්තු අනුව 2025 වසරේ ජංගම ගිණුමේ සමස්ත අතිරික්තය එ.ජ. ඩොලර් බිලියන 1.7ක් ලෙස වාර්තා වේ.
- 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පසුගිය වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. තවද, 2025 වසර තුළදී මෙතෙක් වාර්ෂිකව වාර්තා වූ ඉහළම අපනයන ආදායම වාර්තා වුවද, 2024 වසරට සාපේක්ෂව වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 7.9ක් දක්වා පුළුල් විය.
- පෞද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ඇතුළුව වාහන ආනයනය සඳහා වූ වියදම 2025 වසරේ දෙසැම්බර් මාසය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 301ක් වූ අතර 2025 වසර සඳහා රථ වාහන ආනයන සඳහා වූ මුළු වියදම එ.ජ. ඩොලර් මිලියන 2,047ක් ලෙස වාර්තා විය.
- ආනයන මිල ගණන් පහළ යාම ඉක්මවා අපනයන මිල ගණන් පහළ ගිය බැවින්, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. 2025 වසරේ දී ද වෙළඳ මිල අනුපාතය පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.
- 2025 වසරේ දී ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පැවතුණ අතර, චීනය, ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ප්‍රමුඛතම ආනයන මූලයන් ලෙස පැවතුණි.
- 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 127ක් වූ සේවා ගිණුමේ අතිරික්තය, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 344ක් දක්වා වර්ධනය විය. ඒ අනුව, 2024 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.4ක සේවා ගිණුමේ සමස්ත අතිරික්තයට සාපේක්ෂව 2025 වසරේ දී එම අතිරික්තය එ.ජ. ඩොලර් බිලියන 3.7ක් දක්වා ඉහළ ගියේය.
- 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් මාසික ලක්ෂ්‍යමය සහ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම යන දෙආකාරයෙන් ම ඉහළ යෑමක් වාර්තා කළේය. 2025 වසරේ සංචාරක පැමිණීම්, 2018 වසරේ වාර්තා වූ මට්ටම ද ඉක්මවා ගිය අතර, එය 2024 වසරට සාපේක්ෂව සියයට 15.1ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයකි. කෙසේ වෙතත්, සංචාරක ඉපැයීම්, 2024 වසරට සාපේක්ෂව සියයට 1.6ක සුළු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කළ ද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ මෙරට ගත කරන සාමාන්‍ය කාලය පිළිබඳ ඇස්තමේන්තු අඩු කරමින් සංශෝධනය කිරීම හේතුවෙන් එම ඉපැයීම් තවමත් 2018 වසරේ පැවති මට්ටමට වඩා අඩු අගයක පවතී.
- 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 879ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2025 වසරේ සමස්ත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව සියයට 22.8ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, ඉතිහාසයේ මෙතෙක් වාර්තා වී ඇති ඉහළම අගය වාර්තා කරමින් එ.ජ. ඩොලර් බිලියන 8.0ක සීමාව ඉක්මවා ඇත. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.
- රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 5ක සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කරන ලද අතර, 2024 වසරේ දී වාර්තා වූ ශුද්ධ ගෙවීමට සාපේක්ෂව, 2025 වසරේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සමස්ත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 248ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ද ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 7ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, 2024 වසරේ දී ශුද්ධ ලැබීමක් වාර්තා කිරීමෙන් පසුව, 2025 වසරේ සමස්ත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 122ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- බහු පාර්ශ්වික ආයතන වෙතින් වූ ලැබීම් සහ මහ බැංකුව විසින් සිදු කළ ශුද්ධ විදේශ විනිමය මිල දී ගැනීම් හේතුවෙන්, විදේශීය ණය සේවාකරණ ගෙවීම් අඛණ්ඩව සිදු කිරීම මධ්‍යයේ වුවද, 2025 වසරේ දී, චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව, දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.8ක් දක්වා වර්ධනය විය.
- 2025 වසරේ දී අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2026 වසරේ ජනවාරි මාසය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.2කින් අතිප්‍රමාණය විය.

සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන මාසික විදේශීය අංශ විවරණිකාවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ විදේශීය අංශ සංඛ්‍යාලේඛන වෙබ් පිටුවලින් ලබා ගත හැකි අතර, ඒවාට පහත වෙබ් සබැඳි හරහා ප්‍රවේශ විය හැකිය:

https://www.cbsl.gov.lk/en/external-sector-bulletin
https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)

| කාණ්ඩය | 2024 දෙසැම්බර් (එ.ජ.ඩොලර් මිලියන) | 2025 දෙසැම්බර් (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) | 2024 (එ.ජ.ඩොලර් මිලියන) | 2025 (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **ජංගම ගිණුමේ ශේෂය** | -509.1 | 45.2 | | 1,205.7 | 1,733.4 | 43.8 |
| **වෙළඳ ශේෂය** | -822.7 | -997.2 | | -6,069.4 | -7,898.6 | |
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,101.8 | 1,158.0 | 5.1 | 12,772.0 | 13,581.4 | 6.3 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,924.5 | 2,155.2 | 12.0 | 18,841.4 | 21,479.9 | 14.0 |
| **සේවා ගිණුම (ශුද්ධ)** | 127.1 | 343.8 | 170.4 | 3,434.8 | 3,707.2 | 7.9 |
| සේවා ගිණුම - ලැබීම් | 701.5 | 720.6 | 2.7 | 6,910.0 | 7,065.7 | 2.3 |
| *එයින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් (ආ) | 362.1 | 308.6 | -14.8 | 3,168.6 | 3,219.2 | 1.6 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 156.6 | 188.0 | 20.1 | 1,793.1 | 1,882.4 | 5.0 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා | 75.4 | 70.0 | -7.1 | 848.4 | 799.7 | -5.7 |
| සේවා ගිණුම - ගෙවීම් | 574.4 | 376.9 | -34.4 | 3,475.2 | 3,358.5 | -3.4 |
| *එයින්,* | | | | | | |
| විදේශ සංචාර | 80.6 | 104.9 | 30.0 | 755.4 | 828.6 | 9.7 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 110.2 | 81.0 | -26.5 | 1,010.8 | 994.3 | -1.6 |
| **ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)** | -418.2 | -172.3 | | -2,599.0 | -2,024.3 | |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ලැබීම් | 72.6 | 66.8 | -8.0 | 609.4 | 621.2 | 1.9 |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ගෙවීම් | 490.9 | 239.1 | -51.3 | 3,208.4 | 2,645.5 | -17.5 |
| *එයින්,* | | | | | | |
| සෘජු ආයෝජන ආශ්‍රිත | 163.3 | 111.6 | -31.7 | 941.7 | 1,065.1 | 13.1 |
| විවිධ ආයෝජන ආශ්‍රිත | 184.5 | 67.8 | -63.3 | 877.5 | 507.2 | -42.2 |
| අනෙකුත් ආයෝජන: පොලී | 141.4 | 55.8 | -60.6 | 1,369.0 | 1,044.9 | -23.7 |
| **ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)** | 604.7 | 870.9 | 44.0 | 6,439.3 | 7,949.1 | 23.4 |
| *එයින්,* | | | | | | |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් [1] | 613.8 | 879.1 | 43.2 | 6,575.4 | 8,076.2 | 22.8 |
| පෞද්ගලික සංක්‍රාම ගෙවීම් | 9.1 | 9.0 | -1.0 | 145.9 | 130.4 | -10.6 |
| **මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම්** | | | | | | |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් (ඇ) | -1.6 | -6.7 | | 33.0 | -122.0 | |
| රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් | 18.4 | -4.6 | | -178.9 | 247.9 | |
| සංචිතවල සිදු වූ වෙනස්වීම් (ඈ) | -329.1 | 790.8 | | 1,729.8 | 702.8 | |

**මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ**

(අ) තාවකාලික
(ආ) සංචාරක පැමිණීම්, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකු විසින් දිනක් සඳහා දරන සාමාන්‍ය වියදම් මත පදනම්ව සංචාරක ඉපැයීම් ගණනය කෙරේ. සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය මාසිකව වෙනස් වන අතර, සංචාරක ආගමන දත්ත මත පදනම් වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද නව සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංචාරකයෙකු විසින් එක් දිනක් තුළ දරන වියදමෙහි සාමාන්‍යය 2025 අගෝස්තු මාසයේ සිට සංශෝධනය කරන ලදී
(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව
(ඈ) සංචිත වත්කම් තත්ත්වයට බලපාන තක්සේරු වෙනස්වීම් ඇතුළත් වේ

---

[1] *විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.*